# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2176/10 - 2020 මැයි මස 19 වැනි අඟහරුවාදා - 2020.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උපවගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් 2019 දෙසැම්බර් 5 වන දිනැති 2152/32 දරන *ගැසට් නිවේදනයේ* 2 වන ජේදයේ (ඒ) උපජේදයට වහාම පහතින් පහත උපජේද එකතු කිරීමෙන් සංශෝධනය කරමි.

(ඔ) 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ තිබෙන්නා වූ ඕනෑම අපනයන - අභිමුඛ ව්‍යවසායයන් මගින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ කොවිඩ් - 19 මර්දන මධ්‍යස්ථානය) කොවිඩ් - 19 ව්‍යාප්ති මර්දනය සඳහා වන ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය) වෙත ඔවුන්ගේ ඉල්ලීම මත සපයනු හෝ ප්‍රදානය කරනු ලබන සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සහ ඒ සමාන අයිතම.

(ඕ) කොවිඩ් - 19 වසංගතය මැඩලීම සඳහා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත ආනයනය, ආනයනය සහ සැපයීම සහ ආනයනය සහ පරිත්‍යාග කරනු ලබන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශයට අනුව රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කිරීමට යටත්ව ආනයනය කරනු ලබන වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය හා දන්ත වෛද්‍ය උපකරණ, කොටස්, උපාංග සහ අමතර කොටස් රෝහල්/වෛද්‍ය ගෘහ උපකරණ සහ ඖෂධ රසායනික ද්‍රව්‍ය සහ ඒ හා සමාන භාණ්ඩ කොටස් වශයෙන් ආනයනික භාණ්ඩ සඳහා ඉහත අදාළ නොවන අතර 2020 දෙසැම්බර් 31 දින දක්වා පමණක් වලංගු වේ.

මෙම නියෝගය 2020 මැයි 19 වන දින සිට බල පැවැත්වේ.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 මැයි මස 19 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

07 - 124